# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඩබ්.ජේ.යූ. කුමාර
ගීකියනගෙදර ,
පිටවල,
නාවලපිටිය

**අභියාචක**

**අභියාචනා අංකය : 238/2021**

එදිරිව

කලාප අධ්‍යාපන කාර්යාලය,
හැටන්

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න - සභාපති
2. විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : දෙපාර්ශවය පෙනී නොසිටි.
දෙපාර්ශවයේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග කරන ලදී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2021.01.19
පොදු අධිකාරිය - 2021.01.12

**විභාග කළ දිනය** : 2022.03.02

**තීරණය කළ දිනය** : 2022.03.02

**තීරණය**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2020.08.24 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"2020 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු පිළිබඳව ගිණුම් වාර්තාවක්"*

ඒ අනුව, තොරතුරු නිළධාරි විසින් පනතේ දක්වා ඇති නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2020.09.07 දිනැතිව නම්කළ නිළධාරී වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරි විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර දැක්වීමට

අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2020.10.21 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් 2021.01.12 දිනැතිව කොමිෂන් සභාව වෙත එවා ඇති ලිපිය මඟින් පහත පරිදි කරුණු දක්වා ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

> "...W.J. *උදය කුමාර මහතා විසින් හැටන් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ඉල්ලා සිටින ලද තොරතුරු මේ වන විට ඔහුට ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. පිටපතක් අමුණා ඇත.*"

තවද, අභියාචක විසින් 2021.01.19 වන දින කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කරමින් දන්වා ඇත්තේ, පොදු අධිකාරිය විසින් 2021.01. 12 වන දින ලබාදුන් පිළිතුර වගකීමෙන් තොරව ලබාදී ඇති බවත් එම පිළිතුරෙහි කිසිදු ගිණුම් වාර්තාවක් අන්තර්ගත නොවන බවත් ය.

**සළකා බැලීම**

අභියාචක විසින් ඉල්ලා ඇත්තේ 2020 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු පිළිබඳ ගිණුම් වාර්තාවකි. එසේ වුවත් පොදු අධිකාරිය විසින් අභියාචක වෙත සපයා ඇත්තේ 2016 සහ 2017 වර්ෂ වලට අදාළ වැටුප් රහිත නිවාඩු සඳහා අය කිරීම් පිළිබඳ වාර්තාවකි. ඒ අනුව තොරතුරු ඉල්ලීමට අදාළ වර්ෂයෙහි වාර්තා ඉදිරිපත් කර නොමැති බැවින් එකී තොරතුරු ඉල්ලීමෙහි අන්තර්ගත 2020 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු පිළිබඳ ගිණුම් වාර්තාවක් අභියාචක වෙත පොදු අධිකාරිය විසින් 2022.03.31 දිනට ප්‍රථමව ලබා දිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.